# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## මුදල් (සංශෝධන)

**2018 අංක 35 දරන මුදල් පනත සංශෝධනය කිරීම**
**පිණිස වූ පනත් කෙටුම්පතකි**

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු
අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා විසින්
2020 සැප්තැම්බර් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2020 සැප්තැම්බර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[4 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් 2018 අංක 35 දරන මුදල් පනතේ 36 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2020 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි ණය ආපසු ගෙවීමේ අය බද්ද අය කිරීම අවසන් කිරීම වේ.

# මුදල් (සංශෝධන)

එල්.ඩී.—ඕ. 3/2020

## 2018 අංක 35 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2020 අංක දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2018 අංක 35 දරන පනතේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2018 අංක 35 දරන මුදල් පනතේ 36 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "2021 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2019 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.